**පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය**
**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**

# පුරප්පාඩු

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයට අනුබද්ධ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ පුරප්පාඩු පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් **2025.07.21** දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. කළමනාකරණ සහකාර III ශ්‍රේණිය

| | | | | |
|---|---|---|---|---|
| 1 | **අවශ්‍ය සුදුසුකම්:** | 1. | අ.පො.ස. (සා/පෙළ) විභාගයේදී | |
| | | | i. | සිංහල භාෂාව/දෙමළ භාෂාව |
| | | | ii. | ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍යය |
| | | | iii. | ගණිතය |
| | | | යන විෂයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් හයක් (06) ක් එක් වරකදී සමත්ව තිබිය යුතුය. | |
| | | | **සහ** | |
| | | 2. | අ.පො.ස (උ/පෙළ) විභාගය එක් වරකදී සියලු විෂයයන් සමත් වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර) (පැරණි විෂය නිර්දේශය යටතේ එක් වරකදී විෂයයන් 3ක් සමත් වී තිබීම ප්‍රමාණවත් වනු ඇත.) | |
| | | 3. | පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අය කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ. | |
| | | | අ) | පිළිගත් ආයතනයකින් ලබාගත් මාස හයකට (06) නොඅඩු පරිගණක යෙදුම් පිළිබඳ පිළිගත හැකි පාඨමාලාවක් හදාරා තිබීම. |
| | | | ආ) | පරිගණක යෙදුම් පැකේජ භාවිතය පිළිබඳ වසර දෙකක (02) පළපුරුද්ද |
| 2 | **වෙනත් සුදුසුකම්:** | අ) | ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය. | |
| | | ආ) | අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 30ට නොවැඩි විය යුතුය. | |
| | | ඇ) | යහපත් චරිතයකින් යුක්ත විය යුතුය. | |
| 3 | **වැටුප් පරිමාණය:** | රු. 49,475-17×540 – 58,655 (මාසික) U-MN 1(III) * | | |
| 4 | **බඳවා ගැනීම:** | ලිඛිත හා/හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්<br>• සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ දැනුම<br>• බුද්ධි පරීක්ෂණය සහ සාමාන්‍ය දැනුම<br>• පරිගණක සාක්ෂරතාවය | | |

## 02. වැඩ සහායක III ශ්‍රේණිය

| | | | |
|---|---|---|---|
| 1 | **අවශ්‍ය සුදුසුකම්:** | අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් දෙවතාවකට නොවැඩි වාර ගණනකදී අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයයන් හයක් (06) ක් සමත් වී තිබිය යුතුය. | |
| 2 | **වයස:** | අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. | |
| 3 | **වෙනත්:** | අ) | ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය. |
| | | ආ) | තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව සහ මානසිකව සුදුසු විය යුතුය. |
| | | ඇ) | යහපත් චරිතයකින් යුක්ත විය යුතුය. |
| 3 | **වැටුප් පරිමාණය:** | රු. 42,775-16×450 – 49,975 (මාසික) U-PL 1(III) * | |
| 4 | **බඳවා ගැනීම:** | වෘත්තීය පරීක්ෂණයක් සහ/හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් | |

* ඉහත මූලික වැටුපට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අනුමත කරන ලද අනෙකුත් දීමනා ද අදාළ රෙගුලාසිවලට අනුව ගෙවනු ලැබේ.

**සේවා කොන්දේසි**

1. මෙය ස්ථිර තනතුරකි. පත්වීම් වසර තුනක (03) පරිවාස කාලයක් සඳහා යටත්වය.
2. තෝරාගත් අපේක්ෂකයින් දැනට රජයේ දෙපාර්තමේන්තුවක සේවය කරයි නම් ඔහුගේ/ඇයගේ අදාළ පත්වීම් අධිකාරිය හරහා තම නිදහස් කිරීම ලබා ගත යුතුය.
3. විශ්වවිද්‍යාල සේවයේ යෙදී සිටියදී රජයේ සේවකයින්ට ඔවුන්ගේ විශ්‍රාම වැටුප් අයිතිවාසිකම්පවත්වා ගැනීමට අයිතියක් නොමැත.

**අයදුම්පත් ඉදිරිපත් කළයුතු ආකාරය**

අයදුම්පත් https://ou.ac.lk/vacancies/ යන විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් බාගත කර ගත හැකිය.

සම්පූර්ණ කරන ලද අයදුම්පත් හා සහතික කරන ලද සහතිකවල පිටපත් ද සහිතව **2025.07.21 වන දින හෝ ඊට පෙර** ලැබෙන සේ **නියෝජ්‍ය ලේඛකාධිකාරී, පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, තැ.පෙ. 21, නාවල, නුගේගොඩ** වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම් පස ඉහළ කෙලවරේ ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

උසස් අධ්‍යාපන ආයතනයන්හි, රාජ්‍ය දෙපාර්තමේන්තු, සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවය කරන අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් එවීමට කටයුතු කළ යුතු වේ.

ඉහත පරිදි අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් එවනු නොලබන, අවශ්‍ය විස්තර සඳහන් නොකළ, අපැහැදිලි හෝ අයදුම්පත් නියමිත දිනට පසුව ලැබීම, සුදුසුකම් සහ පළපුරුද්ද සනාථ කිරීම සඳහා අදාළ සහතිකවල ඡායා පිටපත් අමුණා නොතිබීම හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොමැති අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. කිසියම් අයදුම්පත්‍රයක් ප්‍රතික්ෂේප කළ විට කුමන හේතුවක් නිසා හෝ යළි සලකා බැලීම සිදු නොකෙරේ.

**අධ්‍යක්ෂ**
**පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය**
**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**
**නාවල, නුගේගොඩ.**

අයදුම්පත් යොමු කරන අයදුම්කරුවන් පහත දක්වන ඉලෙක්ට්‍රොනික සබැඳිය මගින් අවශ්‍ය අමතර තොරතුරු ලබාදෙන මෙන් ඉල්ලමි.

https://forms.gle/ffF9MazVSSQNqhA49

**නියෝජ්‍ය ලේඛකාධිකාරි**
**පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය**
**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**
**නාවල**
**නුගේගොඩ.**